

# කතෘගෙන්

එළවළු නිෂ්පාදනයේ පැනයන් සොයා ගැනීම සඳහා මෑතක සිට ගොවිකම් දෙපාර්තමේන්තුව විසින් අප දිවයිනේ එළවළු ගොවිතැන ගැන ක්ෂෙත්‍ර සමීක්ෂණයක් පවත්වා ගෙන යනු ලැබේ. දැනට වගාවන එළවළු වර්ග හා ප්‍රමාණයන් සහ, එක් එක් ප්‍රදේශයේ ඒ ඒ එළවළු වර්ග වගාව වැඩි දියුණු කිරීම කොතෙක් දුරට සිදු කළ හැකිදැයි සොයා ගැනීම මෙම සමීක්ෂණයෙන් අදහස් කෙරේ.

මෙම සමීක්ෂණයේ මූලික පරමාර්ථයන් වී ඇත්තේ එළවළු වගාව සඳහා බීජ හා වෙනත් සිටුවීමේ ද්‍රව්‍ය, රසායන පෝර හා කෘෂි—රසායන ද්‍රව්‍ය යනාදිය එළවළු ගොවියා විසින් කෙසේ ලබා ගන්නේදැයි සොයා එම ද්‍රව්‍ය ලබා ගැනීමේ මාර්ගයන් ගොවියාට ප්‍රයෝජනවත් වන අයුරු තහවුරු කිරීමයි. ඒ අතර පාරිභෝගික අවශ්‍යතාවයන් අනුව එක් එක් ප්‍රදේශයේ වෙන වෙන එළවළු වර්ගවල වගාවන් සියුම් ලෙස ඇති කොට එළවළු ගොවිතැන විශේෂඥ කාර්‍යයක් බවට පරිවර්තනය කිරීමේ අදහස මෙයට අඩංගුවී තිබෙයි. එමෙන්ම වාරයට අධික ලෙස නිෂ්පාදනය වන එළවළු කුමන ක්‍රමයට හෝ ක්‍රමයන්ට කල් තබා ගෙන මිළ ප්‍රමාණයන් පදනම් කළ යුත්තේදැයි සලකා බලනු ලැබේ. අලෙවි, ප්‍රවාහන හා ගබඩා කිරීමේ පහසුකම් ගැන සොයා බලා කටයුතු කිරීමද මෙම සමීක්ෂණයේදී සිදු වෙයි.

එළවළු ගොවියාට දේශීය හා විදේශීය එළවළු ඇට ලාභයට, පහසුවට හා කලට වේලාවටද ලබා ගැනීමේ අවහිරකම් රාශියක්ම ඇති බව මෙම සමීක්ෂණයේ දී පළමුව පෙනී ගිය දෙයයි. ඒ අනුව උසස් පෙළේ දේශීය එළවළු ඇට වැඩි

වැඩියෙන් නිපදවීමට ගොවිකම් දෙපාර්තමේන්තුව අවශ්‍ය පියවරයන් රැගෙන තිබේ. ගොවිකම් දෙපාර්තමේන්තුවේ මාර්ගයෙන් දියුණු කළ විදේශීය එළවළු ඇට පිටරටින් ගෙන්වීමටද රජය තීරණය කළේ නිෂ්පාදක ගොවියාට පහසුකම් සැලසීමේ අටියෙනි.

1964 අප්‍රේල්—මැයි වගාකන්නයෙන් ආරම්භ වුනු පළමු වර්ෂය තුළදී විදේශීය එළවළු ඇට රාත්තල් 50,000ක් පිටරටින් ගෙන්වීමට අවශ්‍ය විධිවිධාන ගොවිකම් දෙපාර්තමේන්තුව විසින් යොද, ඉන් පළමු තොග ප්‍රමාණයන් නියමිත කාලයට පිටරටින් ගෙන්වා ගොවීන් අතර අලෙවිකිරීම කරන ලදී. ගොවියාට වුවමනා විදේශීය එළවළු ඇට කලට වේලාවට හා සාධාරණ මිළට සැපයීමේ කාර්‍ය්‍ය හොඳාකාරව සිදු කළ හැක්කේ ඒ ගැන ඒ ඒ පළාත්වල ගොවිකම් ව්‍යාප්ති නිලධාරීන් තදින් උනන්දුවීමෙන් පමණ ය. පළාතේ ව්‍යාප්ති නිලධාරීන්, ගොවීන්ගේ සංවිධානයන් හා ඒ දෙපක්ෂයටම වඩා එක් එක් ගොවියාද එළවළු ඇට බෙද හැරීමේ මෙම නව ව්‍යාපාරයට එක්සත්ව, එක්සිත්ව ආධාර නො දෙන්නේ නම් මෙහි පරමාර්තය සුනු විසුනු වී විදේශීය එළවළු ඇට විකිණීමේ ලාභය නැවත වරක් පෞද්ගලික වෙළෙන්දන්ටම හැරී යෑමට ඉඩ තිබෙයි. ග්‍රාමීය ගොවියාගේ ප්‍රයෝජනය සඳහා රජය විසින් විටින් විට සලසා දෙන පහසුකම් සියයට සියයක්ම ගොවියාට ලබා ගත හැකි පරිදි කටයුතු කරන ලෙස අප පාඨකයින්ගෙන්ද ඉල්ලා සිටින්නෙමු.

එළවළු වගාව වැඩි දියුණු කිරීම ගැන විශේෂ උනන්දුවක් දක්වා ඇති මෙම අවදියේ උඩරට එළවළු වගාව ගැන සටහන් කීපයක් ලිපියක මාර්ගයෙන් මෙම කලාපයෙහි අඩංගු කළේ ඒ පිළිබඳව අපද දයකයන් වීම සඳහා ය.